# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2123/33 - 2019 මැයි මස 14 වැනි අඟහරුවාදා - 2019.05.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978 (xiv)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

20(4)(ආ) වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20 (4) (ආ)වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍ය අ. ඉබතුල් රවුෆ් හකීම් වන මා විසින්, මොරටුව විශ්වවිද්‍යාලයේ, තාක්ෂණ විද්‍යා ආයතනයේ පරිපාලන කටයුතු බරපතල ලෙස ව්‍යාකුල වී ඇති බවට සහ එය සාමාන්‍ය තත්ත්වයට නැවත පත්කිරීමට එම ආයතනයේ බලධාරීන් අපොහොසත් වී ඇති බවට සෑහීමට පත්වීමෙන් පසු, එකී පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියමයක්, නියමාවලියක්, ප්‍රඥප්තියක්, අතුරු ව්‍යවස්ථාවක්, නියෝගයක් හෝ රීතියක් යටතේ මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ වෙත පිරිනමන ලද, පනවන ලද හෝ පවරන ලද පිළිවෙළින් යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ, ඉටුකිරීමේ හෝ කිරීමේ කාර්යය සඳහා එකී මොරටුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණ විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ වෙනුවට නිසි බලධරයා වශයෙන් මේජර් ජනරාල් (විශ්‍රාමික) ශාන්ත කුමාර් තිරුණාවුකරසු 2019 මැයි මස 15 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මේ නියමය මගින් පත්කරමි.

**අ. ඉබතුල් රවුෆ් හකීම්,**
නගර සැලසුම්, ජලසම්පාදන හා
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 මැයි මස 13 වැනි දින,
කොළඹ දී ය.

05 - 784


1A - PG 4519 — 507 (2019/05)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*